# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# පශ්චාද් උපාධි නිර්ණායක

## දර්ශනසූරි උපාධි පාඨමාලාව

**01. SLQF 12**

**විෂයධාරාව**

බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/බෞද්ධ ශිෂ්ටාචාරය/බෞද්ධ අධ්‍යයනය/සිංහල/පාලි/සංස්කෘත/පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය/ඉංග්‍රීසි

**මාධ්‍යය**

සිංහල/ඉංග්‍රීසි

**02. ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- ඉහත විෂයධාරාවන්ට අදාළ ව පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර දෙකකට නොඅඩු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම.
  හෝ
- මෙම සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**03. අයදුම් කළ යුතු පිළිවෙළ**

- අයදුම්පත් විශ්වවිද්‍යාලයේ කොළඹ 07 හි පිහිටි පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයෙන් හෝ හෝමාගම, පිටිපන උතුර පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් හෝ විශ්වවිද්‍යාලයේ බලය ලත් නියෝජිතයෙකුගෙන් හෝ අන්තර්ජාලය මගින් (www.bpu.ac.lk) ලබා ගත හැකි ය.

**<u>කොළඹ 07 පරිශ්‍රය</u> :**

පශ්චාද් උපාධි හා බාහිර විභාග
අධ්‍යයන මධ්‍යස්ථානය,
නො. 214,
බෞද්ධාලෝක මාවත,

**<u>හෝමාගම පරිශ්‍රය</u> :**

හෝමාගම පිටිපන පිහිටි ප්‍රධාන
පරිපාලන කාර්යාලය,
නො. 37, මොරගහහේන නගරය,
පිටිපන උතුර, කොළඹ 07.
හෝමාගම.

- අයදුම්පත් ගාස්තුව රු 1000/= කි. ලංකා බැංකුව, හෝමාගම ශාඛාවේ ගිණුම් අංක 711202 ට බැර වන සේ ලංකාවේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට බැර කළ ලබා ගත් කුවිතාන්සිය සමඟ මෙම විශ්වවිද්‍යාලයට පැමිණ හෝ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ හැකිය.
- විධිමත් ව සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ පර්යේෂණයේ මාතෘකාව සහිත දළ සටහනක් ඉදිරිපත් කළ යුතු ය. (වචන 300කට නොඅඩු)

**04. ලියාපදිංචිය**

- විධිමත් ව ඉදිරිපත් කළ අයදුම්පත විශ්වවිද්‍යාලයේ උසස් උපාධි කමිටුවේ නිර්දේශය පරිදි සනාතන සභාව පිළිගත් පසු පත් කරනු ලබන උපදේශක ආචාර්යවරයාගේ උපදෙස් මත මාසයක් ඇතුළත ස්වකීය පර්යේෂණ සැලැස්ම ඉදිරිපත් කළ යුතු ය.

- විෂයට අදාළ ව අංශාධිපති විසින් පත් කරනු ලබන ඇගයීම් මණ්ඩලය ඉදිරියේ පර්යේෂණ සැලැස්මට අදාළ ප්‍රස්තුතීකරණයක් (Presentation) ඊළඟ මාස 02 තුළ ඉදිරිපත් කළ යුතු ය.
- ප්‍රස්තුතිකරණය කරනු ලබන දිනය **ලියාපදිංචි දිනය** වශයෙන් සලකනු ඇත.

## 05. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සම්මන්ත්‍රණ

- ලියාපදිංචියෙන් පසු ආයතනය මගින් සංවිධානය කරනු ලබන පර්යේෂණ ක්‍රමවේදය සම්බන්ධ දේශන මාලාවට අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු ය.

## 06. ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

සෑම මාස 06කට වරක් ම උපදේශකවරයාගේ නිර්දේශය සහිත ව ප්‍රගති වාර්තා පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 07. පර්යේෂණ කාලසීමාව

පර්යේෂණයේ කාලසීමාව ලියාපදිංචි වූ දිනයේ සිට වසර 03කි.

## 08. ලියාපදිංචි කාලය දීර්ඝ කිරීම

- ලියාපදිංචිය දීර්ඝ කරනු ලබන්නේ උපරි ම වර්ෂ 04කි. ලියාපදිංචියෙන් **වර්ෂ හතකට (07)** පසු ව කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ නොකෙරේ.
- යම් අපේක්ෂකයෙකුට නියමිත කාලය තුළ පර්යේෂණය අවසන් කිරීමට නොහැකි වුවහොත් උපදේශකවරයාගේ නිර්දේශය අනුව කාලය දීර්ඝ කර ගත හැකි ය. (දීර්ඝ කරනු ලබන්නේ උපරි ම වර්ෂ 04කි)
- අපේක්ෂකයාගේ ඉල්ලීම උපදේශක ආචාර්යවරයා මගින් ඉදිරිපත් කළ යුතු ය. කාලය දීර්ඝ කිරීම වලංගු වන්නේ එක් වරකට එක් වසරකට පමණි. එහෙයින් සෑම ලියාපදිංචි වසරක් අවසන් වීමට මාස 03කට පෙර මෙම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

## 09. ප්‍රස්තුතීකරණය ඉදිරිපත් කිරීම

### I පර්යේෂණ සැලැස්මට අදාළ ප්‍රස්තුතීකරණය

ලියාපදිංචි වී පළමු වසරෙහි පළමු මාස 06 ඇතුළත ස්වකීය පර්යේෂණ සැලැස්මට අදාළ ව අධ්‍යයන මණ්ඩලය ඉදිරියේ ප්‍රස්තුතීකරණයක් කළ යුතුය.

### II සාහිත්‍ය විමර්ශන ප්‍රස්තුතීකරණය

ලියාපදිංචි වී දෙවන වසරෙහි පළමු මාස 06 ඇතුළත ස්වකීය පර්යේෂණයට අදාළ ව සාහිත්‍ය විමර්ශනයක් ද සහිත ව අධ්‍යයන මණ්ඩලය ඉදිරියේ ප්‍රස්තුතීකරණයක් කළ යුතුය.

## 10. නිබන්ධ උපදේශකවරුන් හා පරීක්ෂකවරුන් පත් කිරීම

### උපදේශකවරුන් පත් කිරීම

- උසස් උපාධි කමිටුව මගින් යෝජනා කරනු ලබන නිබන්ධ උපදේශකවරුන් සනාතන සභාව මගින් අනුමත විය යුතු ය.
- සිය පර්යේෂණ නිබන්ධය සඳහා උපදේශකවරයෙකු යෝජනා කිරීමේ අයිතිය අපේක්ෂකයාට හිමි වන අතර, එම ඉල්ලීම සලකා බැලීම උසස් උපාධි කමිටුව සතු වේ.

### නිබන්ධ පරීක්ෂකවරුන් පත් කිරීම

- උසස් උපාධි කමිටුව මගින් යෝජනා කරනු ලබන බාහිර පරීක්ෂකවරුන් දෙදෙනෙකු විසින් නිබන්ධය පරීක්ෂා කළ යුතු ය.
- නිබන්ධය පරීක්ෂා කිරීම සඳහා පත් කරනු ලබන පරීක්ෂකවරුන්ට උපරි ම වශයෙන් මාස 03ක කාලයක් ලබා දෙනු ලැබේ. අදාළ කාලය තුළ පරීක්ෂණ වාර්තා නොලැබුණහොත් තවත් මාස 03ක් ඇතුළත සිහිකැඳවීම් 02ක් යොමු කරනු ලැබේ.

- එම කාලය ඇතුළත නිබන්ධය පරීක්ෂා කිරීමට එම බාහිර පරීක්ෂකවරුන් අසමත් වුවහොත් එය පශ්චාත් උපාධි සහ බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ ප්‍රධානියා විසින් උසස් උපාධි කමිටුවට වාර්තා කළ යුතු ය.
- එය සලකා බලා වෙනත් බාහිර පරීක්ෂකවරුන් උසස් උපාධි කමිටුව විසින් පත් කළ යුතු ය.

## 11. උපදේශකවරයා වෙනස් කිරීම හෝ මාරු කිරීම

- උපදේශකවරයා විදේශගත වීමේ දී හෝ වෙනත් පිළිගත හැකි හේතුවක් මත වෙනස් කර ගත හැකි ය. මෙම ඉල්ලීම පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරී වෙත ලිඛිත ව කළ යුතු ය. එම ඉල්ලීම උසස් උපාධි කමිටුවේ නිර්දේශය මත සනාතන සභාවේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ.

## 12. පර්යේෂණ නිබන්ධයේ ප්‍රමාණය

- වචන 75,000කට නොඅඩු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කළ යුතු ය. එම පර්යේෂණ නිබන්ධය අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමකාලීන දැනුම පුළුල් කරන්නක් මෙන් ම නවතාවකින් යුක්ත වූවක් ද විය යුතු ය.
- නියමිත කාලය ඉක්ම යෑමට පෙර නිබන්ධයේ පිටපත් තුනක් උපදේශකවරයාගේ නිර්දේශය සහිත ව පශ්චාද් උපාධි සහ බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයට ඉදිරිපත් කළ යුතු ය.

## 13. පර්යේෂණ නිබන්ධය භාර දීම

- පර්යේෂණ නිබන්ධය භාර දීමට නියමිත දිනට මාස 03කට පෙර පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය වෙත ලිඛිත ව දැන්විය යුතු ය.
- කිසියම් හේතුවකින් නියමිත දිනට පර්යේෂණ නිබන්ධය බාරදීමට නොහැකි වන්නේ නම් ඒ බව ලිඛිත ව දැනුම් දිය යුතු ය.
- පර්යේෂණ නිබන්ධය භාර දීමට පෙර ප්‍රගති වාර්තා, ප්‍රස්තුතීකරණ හා සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය.
- පර්යේෂණ නිබන්ධය භාර දෙන විට සියලු ගෙවීම් අවසන් කොට තිබිය යුතු ය.
- තාවකාලික බැම්ම යොදා (Spirals Code) නිබන්ධ පිටපත් 03ක් භාර දිය යුතු ය.
- පර්යේෂණ නිබන්ධය භාර දෙන අවස්ථාවේ දී උපදේශක ආචාර්යවරයා විදේශගත වී හෝ මියගොස් ඇත්නම් උපදේශකවරයා වෙනුවට වෙනත් උපදේශකවරයෙකු හෝ උපදේශකවරුන් නිර්දේශ කිරීමේ බලය අදාළ අධ්‍යයනාංශයේ අංශාධිපති වෙත පැවරෙනු ඇත.

## 14. වාචික පරීක්ෂණය

- නිබන්ධ පරීක්ෂකවරුන්ගේ වාර්තා ලැබුණු පසු නිබන්ධය පිළිබඳ වාචික පරීක්ෂණය (Viva Examination) පවත්වනු ලැබේ.

## 15. උපාධිය වලංගු දිනය

පර්යේෂණ නිබන්ධය භාරදුන් දිනය උපාධිය වලංගු දිනය ලෙස සැලකේ.

2017.01.01 දින සිට ලියාපදිංචි වන විද්‍යාර්ථීන් සඳහා මෙම නිර්ණායක ක්‍රියාත්මක වේ.